# ප්‍රසම්පාදන දැන්වීම

සත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,

සබරගමුව පළාත් සභාව - රත්නපුර.

සත්ව ආහාර මිල දී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, සබරගමුව පළාත්සභාව ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් පහත සඳහන් සත්ව ආහාර හා සත්ව ආහාර අමුද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මිලගණන් කැඳවනු ලැබේ.

| අයිතමය | ප්‍රමාණය (මෙ. ටො.) (2012/12/31 දක්වා) | ලංසු බැඳුම්කරය(SLR) |
|---|---|---|
| ඩේරි කැට්ල් පෙලට් | 10 | 4800/- |
| චික් ක්‍රම්බල්ස් | 30 | 12000/- |
| ග්‍රෝවර් ක්‍රම්බල්ස් | 02 | 800/- |
| ලේයර් ක්‍රම්බල්ස් | 01 | 700/- |
| බ්‍රොයිලර් ස්ටාටර් ක්‍රම්බල්ස් | 1.8 | 1600/- |
| බ්‍රොයිලර් ෆිනිෂියර් පෙලට්ස් | 2.5 | 2100/- |
| පිග් ස්ටාටර් | 01 | 750/- |
| පිග් ෆිනිෂියර් | 01 | 750/- |
| ඊරි ආහාර පෙලට්ස් | 10 | 7300/- |
| බඩඉරිඟු ඇට කැබලි | 10 | 4700/- |
| සෝයා පුන්නක්කු | 05 | 3250/- |
| පොල් පුන්නක්කු | 08 | 2960/- |
| සහල් නිවුඩු | 20 | 9400/- |
| කැඩුනු සහල් | 05 | 1250/- |

02. 2012පෙබරවාරි 06 දින සිට 2012 මාර්තු 05 දක්වා, සතියේ වැඩකරන දිනවලදී පෙ.ව. 9.00 සිට ප.ව.3.00 දක්වා මෙම කාර්යාලයේ ගිණුම් අංශයෙන් ආපසු නොගෙවන රුපියල් 500/- ක් ගෙවා ප්‍රසම්පාදන ලේඛන ලබාගත හැකිය.

03. ඉදිරිපත් කරණ ලද මිල ගණන් සඳහා ඉහත සඳහන් පරිදි පිළිගත් බැංකුවකින් ලබාගත් ලංසු බැඳුම්කරයක් හෝ මෙම දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ නමින් මුදල් තැම්පත් කර ලබාගත් කුවිතාන්සියක් මිල ගණන් සමඟ ඉදිරිපත් කල යුතුය.

04. සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ප්‍රසම්පාදන ලේඛන **2012**මාර්තු 06 පෙ.ව.10.00 ට පෙර ලැබෙනසේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ දෙපාර්තමේන්තුවේ තබාඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කලයුතුය.මිලගණන් බහා එවන කවරයේ ඉහළ වම් කෙලවරේ " සත්ව ආහාර සඳහා මිලගණන්"යනුවෙන් සඳහන් කල යුතුය.

05. 2012 මාර්තු 06 දින පෙ.ව.10.15 ට ටෙන්ඩර් විවෘත කරනු ලබන අතර , සැපයුම් කරුට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයකු එම අවස්ථාවට සහභාගි විය හැකිය.

06. මෙම ටෙන්ඩර් කැඳවීම සම්බන්ධයෙන් පැන නගින ඕනෑම ගැටලුවක් සම්බන්ධයෙන් සහ මිලදීගනු ලබන ප්‍රමාණයන් පිළිබඳ අවසන් තීරණය ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

07. මෙම ටෙන්ඩර් දැන්වීම www.sg.gov.lk වෙබ් අඩවියෙන්ද ලබා ගත හැකිය.

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
සබරගමුව පළාත් සභාව- දුර. අංක. 0452226927 - 2012 පෙබරවාරි 01